## මන්මුනේයි නිරිත ප්‍රාදේශිය සභාව
## මඩකලපුව දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 09 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි නිරිත ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම
-------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක්වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) මහජන පොළ කඩ කාමර බදුකරුවන්ගෙන් 2010 සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ රු. 232,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිලධාරින් හතර දෙනෙකුගෙන් අයවියයුතු ණය ශේෂයවන රු. 343,139 ක මුදලක් අයකර ගැනීම සඳහා 2014 ජූලි 31 දින දක්වා කටයුතුකර නොතිබුණි.

(ඇ) "ජෙයිකා" ව්‍යාපෘතියේ වැඩසටහන් අධ්‍යක්ෂකවරයා වෙත එම වැඩසටහනට සම්බන්ධ කාර්මික සහායක වැටුප් වශයෙන් 2012 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ගෙවාතිබූ අත්තිකාරම් රු. 47,255 ක මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් 2014 ජූලි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු | |
| ඉඩම් හා ගොඩනැගිලි | 134,144,716 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,027,926 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විස්තරාත්මත උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු | 4,867,033 | |
| පුස්තකාල පොත් | 1,530,911 | |

1.35 නීති, රීති රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

-------------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයදී නිරීක්ෂණ විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබන නිශ්චල වත්කම් හදුනාගෙන එම වත්කම්වල වාර්ෂික වටිනාකම් තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට කටයුතුකර තොතිබුණි. |
| (ආ) ප්‍ර දේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති-1988 | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් තුන් දෙනෙකුට ක්‍රමානුකුලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයේදී ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.2,972,227 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.1,053,645 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,918,582 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

----------------------------

2.2.1 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 මුද්දර ගාස්තු
------------------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 නිෂ්ක්‍රිය වත්කම්
------------------

(අ) USAID ආයතනයෙන් 2011 වසරේදී පරිත්‍යාගය ලෙස ලබා දී තිබූ "Roller සහ Twin Drum Roller" යන්ත්‍රය අළුත් වැඩියා නොකිරීමේ හේතුවෙන් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන වාහන අංගනයේ නවතා තිබූ බව 2014 මැයි 30 දින පවත්වන ලද විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ආ) මහජන පොල ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 12 කින් කඩ කාමර 03 ක් බදු දීම සඳහා අවශ්‍ය කටයුතු නොකර 2014 ජූලි 31 දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ දක්වා ඇති නමුත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 50 % සිට 75 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) අයවැය පාලනය